# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,676 - 2010 ඔක්තෝබර් මස 15 වැනි සිකුරාදා - 2010.10.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1786 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1788 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1783 - B 80161— 8,870 (2010/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකියඃ-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 නොවැම්බර් මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | මහියංගනය | බින්තැන්න බටහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බින්තැන්න කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |



## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත් ''සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150. "කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05" යන ලිපිනයට 2010.11.04 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරය වම්පස ඉහළ කෙළවරේ "ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. තැපෑලෙන් එවන ඉල්ලුම්පත් හැර වෙනත් ආකාරයෙන් එවන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

02. සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති බව සහතික විය යුතුය.:-

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය;
(*ආ*) විශිෂ්ට චරිතයකින් යුක්ත හා ශාරීරික වශයෙන් යෝග්‍ය අයෙකු විය යුතුය;
(*ඇ*) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 33ට නොවැඩි විය යුතුය;
(*ඈ*) අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවා කොන්දේසි* :

(i) *වැටුප්.*—මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා. ප. චක්‍රලේඛ අංක 06/2006 (iv) MN-5A
රු. 16,720—10 x 320 — 11 x 365 - 15 x 450 - රු. 30,685
(ii) තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
(iii) රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1434/5 හා 2006.02.27 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව තෝරාගන්නා අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

04. *පත්වීමේ කොන්දේසි* :

(i) බඳවා ගනු ලබන නිලධාරීන් මාස 06ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සඳහා යොදවනු ලැබේ.
(ii) බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබාදෙන රජයේ ගබඩා භාණ්ඩ වෙනුවෙන් රු. 25,000ක මුදල් ඇපයකට බැඳිය යුතුය.
(iii) පුහුණු කාලයෙන් පසුව ඉදිරියට තවත් අවුරුදු 06ක කාලයක් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ මිනින්දෝරුවරයෙකු වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඔවුන් යටත් වන අතර ඒ සඳහා රු. 1,50,000කට නොඅඩු වත්කම් ඇති ඇපකරුවකු සමග ගිවිසුමකට හා ඇප ඔප්පුවකට ඔවුන් ඇතුළත් විය යුතුය.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් තිබිය යුතුය. මෙම වර්ෂයේ මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි අවසන් පරීක්ෂණයේ ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින උපාධි අපේක්ෂකයන්ට ද ඉල්ලුම් කළ හැක. කෙසේ වෙතත් සම්මුඛ පරීක්ෂණයේ දී උපාධි සහතික ඉදිරිපත් කළ යුතුය.

06. *තෝරාගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තෝරා ගැනීම් සිදු කරනු ලැබේ. මෙහිදී මිනින්දෝරු විද්‍යා උපාධි විභාගයේ කුසලතා අනුපිළිවෙල ද සැලකිල්ලට ගනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කරන අදාළ සුදුසුකම් සපුරා ඇති සියලුම මිනින්දෝරු උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුය. :

(i) උප්පැන්න සහතිකය;
(ii) උපාධි සහතිකය ඇතුළු සෙසු අධ්‍යාපන සහතික;
(iii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iv) චරිත සහතික දෙකක්, මින් එකක් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සමගින් ග්‍රාම සේවක නිලධාරී සහතිකයක් විය යුතුය.;
(v) පරිගණක හැකියාව පිළිබඳ සහතික;
(vi) මව් භාෂාවට අමතරව වෙනත් භාෂා පිළිබඳ දැනුම සනාථ කිරීම සඳහා සහතික;
(vii) ක්‍රීඩා කුසලතා පිළිබඳ සහතික.

07. අවශ්‍ය කොන්දේසි සපුරා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන කාලයේ දී හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේත් නැත්නම්, යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම්, ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට සිදුවනු ඇත.

09. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙක් නම් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් තැපෑලෙන් එවන අයදුම්පත් නැතිවීම ගැන වගකීම් භාරගනු නොලැබේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි,

ටී. අශෝක පීරිස්,
ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

2010 සැප්තැම්බර් මස 27 වැනි දින,
අංක 80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### *ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව*

*ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත*

01. නම :

1.1 මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. : SLIVA, A. B.)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————.
1.5 නිකුත් කළ දිනය :————.

02. ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ලිපි එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජන වර්ගය :

සිංහල 1, දෙමළ 2, ඉන්දියානු දෙමළ 3,
මුස්ලිම් 4, වෙනත් 5 ☐
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

3.1 පුරවැසිභාවය :————.
(පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සඳහන් කරන්න)

04. ස්ත්‍රී පුරුෂ භාවය :

ස්ත්‍රී 1, පුරුෂ 0 ☐
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

05. විවාහක/අවිවාහකභාවය :————.

06. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

6.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :———. මාස :———. දින :———.

07. අධ්‍යාපන සුදුසුකම් :

(i) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධිය හා සමත් වූ වසර :————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) විභාග අංකය :————.
(vi) පන්තිය (ඉහළ/පහළ) :————.
(vii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

08. පරිගණක විද්‍යාව පිළිබඳ හදාරා ඇති පාඨමාලා විස්තර :————.

09. මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවන්ගේ දැනුම :————.

10. ක්‍රීඩා කුසලතා :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔබ උසාවියෙන් වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර දැන්විය යුතුය :————.

13. ඔබ දැනට රජයේ සේවයේ නියුතු අයෙකු නම් අයදුම්පත් භාරගන්නා දිනට වැඩ තහනමකට ලක්ව තිබේ ද යන්න :————.

මා විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර කිසිවක් වැරදි හෝ අසත්‍ය බැව් අනාවරණය වුවහොත් තෝරාගැනීමට සලකා බලනු නොලබන බවත් හා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම හොඳාකාරව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණක් මෙම කොටස අදාළ වේ)

සර්වේයර් ජනරාල්,

මෙම ආයතනයේ සේවය කරන ඉහත සඳහන් ...................... මහතා / මහත්මිය / මෙනෙවිය ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ඇය කිසියම් විනයානුකූල දඬුවමකට භාජනය කර නොමැති අතර මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් නිදහස් කරනු හැකිය/ නොහැකිය.

————.
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

10-493

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය — ඔරුගොඩවත්ත**

2011 වර්ෂය සඳහා ආධුනික/ආධුනිකාවන් බඳවා ගැනීමට පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :—

| *අංක* | *පාඨමාලාව (පූර්ණ කාලීන)* | *පාඨමාලා කාලය මාස* | *පාඨමාලා ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| 01 | විදුලි කාර්මික ශිල්පි (Electrician) Level 04 | 24 | 2,500 0 |
| 02 | යාන්ත්‍රික ශිල්පී (Machinist) Level 04 | 24 | 3,000 0 |
| 03 | පෑස්සුම් ශිල්පී (Welder) Level 04 | 24 | 2,500 0 |
| 04 | ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී (Refrigeration and Air-conditioning Mechanic) Level 03 | 24 | 3,000 0 |
| 05 | උපකරණ තාක්ෂණ ශිල්පී (Instrument Technician) Non NVQ | 24 | 10,000 0 |
| 06 | කාර්යාල උපකරණ අළුත්වැඩියා කරන්නා (Office Equipment Repairer) Non NVQ | 24 | 5,000 0 |
| 07 | ඉදිකිරීම් හා ජලනල ශිල්පී (Construction and Plumber) Level 03 | 24 | නොමිලේ |

| අංක | පාඨමාලාව (පූර්ණ කාලීන) | පාඨමාලා කාලය මාස | පාඨමාලා ගාස්තුව රු. ශත |
|---|---|---|---|
| 08 | මෝටර් රථ විදුලි ශිල්පී (Auto Electrical) Level 03 | 24 | 7,000 0 |
| 09 | විදුලි මෝටර් එතුම් ශිල්පී (Electric Motor Winder) — Level 03 | 12 | නොමිලේ |
| 10 | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී (Aluminium Fabricator) Level 03 | 12 | 2,000 0 |
| 11 | පරිගණක යෙදුම් සහයක (Computer Application Assistant) Level 03 | 12 | 4,000 0 |
| 12 | ජංගම දුරකථන අළුත්වැඩියා කරන්නා (Mobile Phone Repairer) Non NVQ | 12 | 10,000 0 |
| 13 | ප්‍රමාණ සමීක්ෂක (Quantity Surveyor) Non NVQ | 12 | 20,000 0 |
| 14 | උද්‍යාන අලංකරණ ශිල්පී (Landscapist) Non NVQ | 12 | 1,000 0 |
| 15 | සන්නිවේදනය හා පුවත්පත් මාධ්‍ය අධ්‍යයනය (Communication and Journalism Studies) Non NVQ | 24 | 15,000 0 |

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත (අර්ධකාලීන පාඨමාලා)**

| අංකය | පාඨමාලාව | කාලය පැය | පාඨමාලා ගාස්තු රු. ශත |
|---|---|---|---|
| 01. | විදුලි කාර්මික මෝටර් පාලක පරිපථ | 100 | 5,500 |
| 02. | ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම | 150 | 7,000 |
| 03. | පරිගණක දෘඩාංග ශිල්පී | 100 | 8,300 |
| 04. | පරිගණක වැඩසටහන් ක්‍රියාකරු | 100 | 5,000 |
| 05. | විදුලි මෝටර් එතුම් ශිල්පී | 100 | 5,000 |
| 06. | ඉලෙක්ට්‍රොනික් | 100 | 7,000 |
| 07. | ජංගම දුරකථන අළුත්වැඩියාව | 100 | 5,000 |
| 08. | ඇලුමිනියම් පිරිසැකසුම් කාර්මික | 120 | 7,500 |

පූර්ණකාලීන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :
අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව : අවුරුදු 17 - 30 අතර වේ.

*අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්* :

- පාඨමාලා අංක 01, 02 හා 04 සඳහා අ. පො. ස. (සා. පෙළ) විද්‍යාව, ගණිතය ඇතුළු විෂයන් 06කින් සමත්වී තිබීම.
- පාඨමාලා අංක 05, 13 සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයට විද්‍යාව, ගණිතය විශිෂ්ට සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම හා අ. පො. ස. (උ. පෙළ) විද්‍යා/ගණිත අංශයෙන් පෙනී සිටීම.
- පාඨමාලා අංක 11 සඳහා අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වීම.
- පාඨමාලා අංක 06, 08 සහ 12 සඳහා අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත් වීම.
- පාඨමාලා අංක 15 සඳහා අ. පො. ස. (සා. පෙළ) සිංහල භාෂාව සම්මාන සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම සහ අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටීම.
- 03, 07, 09, 10, 14 යන පාඨමාලා සඳහා 09 ශ්‍රේණිය සමත් වීම.
- අපේක්ෂකයාගේ දැනුම ආකල්ප හා කුසලතා පදනම් කරගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම ද සලකා බැලේ.

*ඉහත පාඨමාලා හදාරන ඔබට, ඔබේ දරුවාට පුහුණු කාලය තුල ලැබෙන වරප්‍රසාද :*

- දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම්
- අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- රැකියා ලොව ඉහල පිළිගැනීමට ලක් වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතිකය (NVQ Level)
- වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම
- ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්
- නායකත්ව, සෞඛ්‍ය හා ආධ්‍යාත්මික ගුණවගා පුහුණු වැඩසටහන්
- සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය

*විශේෂයි :*

- සම්පූර්ණ පුහුණු පාඨමාලා කාලයෙන් මාස 6ක් පාඨමාලාවට අදාලව ආයතනික පුහුණුව
- ආයතනික පුහුණු කාලය තුල සිත්ගන්නාසුලු දීමනාවක්
- පුහුණුවෙන් පසු රැකියා සඳහා යොමු කිරීම
- කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය
- දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය

පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම :

ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුලත් කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් 2010.11.10 දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න. :-

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.
දුරකථන අංකය : 011-2572976.

10-452

---

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**

වෘත්තීය සංවර්ධනය සඳහා මග

**උසස් තාක්ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2011 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන මෙහි පහත දැක්වෙන උසස් ජාතික ඩිප්ලෝමා හා ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2009 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල පැරණි හා නව නිර්දේශය යටතේ අ.පො.ස. (උ./පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත් :*

ආදර්ශ අයදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම්පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 250ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන වීදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත "අ" කොටසේ සඳහන් ඔබ තෝරාගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්ෂණ ආයතනයට හෝ උසස් තාක්ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම්කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 250ක වටිනාකමකින් යුත් කුවිතාන්සි සමගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැර කරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරා ගත යුත්තේ "ආ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්ත දිවා කාලයේ ද පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

දිවා පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන ඉංග්‍රීසි පාඨමාලා සඳහා සෑම සමාසිකයකටම රු. 4,000 බැගින් අයකරනු ලැබේ. උසස් ජාතික ගණකාධිකරණ පාඨමාලාවේ පළමු වැනි හා දෙවැනි වසර සඳහා රු. 2,000 ක් ද තෙවැනි හා සිව්වැනි වසර සඳහා රු. 3,000 ක් ද සෑම සමාසිකයකටම අයකරනු ලැබේ. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා අර්ධ කාලීන පාඨමාලාව සඳහා සෑම සමාසිකයකටම රු. 10,000ක් බැගින් අයකරනු ලැබේ. (වසරකට සමාසික දෙකකි). මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනයකට යටත්වේ.

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. **මුල් සහතික නොමැති අවස්ථාවල දී ලියාපදිංචියේ දී ඒවා ඉදිරිපත් කිරීමේ එකඟතාවය මත පමණක් සහතික කළ ඡායාපිටපත් භාරගනු ලැබේ.**

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් හා අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ද සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම් ලත් සිසුන්ගේ ස්ථිර පදිංචියේ දුරස්ථභාවය අනුව පමණි.

### *"අ" කොටස*

***උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ඒවායේ සංකේත අංක, ලිපිනයන් හා දුරකථන අංක :***

| *සංකේත අංකය* | *ආයතන* | *ලිපිනයන්* | *දුරකථන අංක* | |
|---|---|---|---|---|
| 01 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල | වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270 | 011-2738349 |
| 02 | ගාල්ල උසස් තාක්‍ෂණ ආයතනය, ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව අක්මීමන | 091-2227880 | 091-2246179 |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644 | 081-2232097 |
| 04 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911 | 037-2229583 |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව් , බදුල්ල | 055-2230218 | 055-2223818 |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය | අංක 665/5 වෙරළ පාර, යාපනය | 021-2222595 | — |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, නයිවල | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519 | 033-2292544 |
| 08 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2223035 | 063-2222056 |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නිය පාර, වරෝධය නගර් ත්‍රිකුණාමලය | 026-2223232 | 060-2222593 |
| 10 | කෑගල්ල උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297 | — |
| 11 | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය | කාර්මික විදුහල, නව නගරය, අනුරාධපුරය | 025-2234417 | — |
| *12 | උසස් තාක්ෂණ ආයතන අංශය, රත්නපුරය | අංක 14, නව වෙළෙඳ සංකීර්ණය, රත්නපුරය | 045-2230780 | — |
| 13 | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | — |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | කාර්මික විදුහල, මාන්චන්තුඩුවෙයි, මඩකලපුව | 065-2247519 | — |
| *15 | උසස් තාක්ෂණ ආයතන අංශය, තංගල්ල | කලාප අධ්‍යාපන කාර්යාලය, තංගල්ල | 047-2240267 | 091-2246179 |

* රත්නපුරය හා තංගල්ල උසස් තාක්ෂණ ආයතන අංශවල ලිපිනයන් 2011 ජනවාරි මාසයේ දී වෙනස්විය හැකිය.

**පාඨමාලා හා ඒවා පැවැත්වෙන ආයතන, සහ ආයතන අංශ :**

| *පාඨමාලාව* | *කාලය වසර* | *පාඨමාලා පැවැත්වෙන ආයතනයන්හි සංකේත අංක* |
|---|---|---|
| 1. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (උ.ජා.ග.ඩි) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 4 | 1,2,3,4,5,6,7,8,9,10,11,13,14 |
| 1.1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - සතිඅන්ත/අර්ධකාලීන (ඉංග්‍රීසි, සිංහල හා දෙමළ මාධ්‍ය) | 4 | 1,2,3,4,5,6,7,9,10,11,12,13,14,15 |
| 2. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (උ.ජා.ක.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 1,2,3,4,5,6 |
| 3. උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා (උ. ජා. ව්‍යා. ප. ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 1/2 | 1, 2, 3, 5, 6 |
| 4. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා (උ. ජා. තො. තා. ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 1/2 | 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 |
| 4.1 උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා (උ. ජා. තො. තා. ඩි.) - සති අන්ත/අර්ධ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 | 5, 6 |
| 5 උසස් ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය (උ. ජා. තා. ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 3 | 2, 7, 8 |
| 6 උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ. ජා. ඩි. - ඉංග්‍රීසි) - දිවා/පූර්ණ කාලීන | 2 | 1, 2, 3, 4, 5, 6, 8, 10 |
| 6.1 උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ. ජා. ඩි. - ඉංග්‍රීසි) සති අන්ත/අර්ධ කාලීන | 2 1/2 | 1, 2, 3, 4, 5, 6, 8, 9, 10, 11, 13, 14 |
| 7 උසස් ජාතික ව්‍යාපාර හා මූල්‍ය ඩිප්ලෝමා (උ. ජා. ව්‍යා. මු. ඩි) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 1/2 | 1 |

*සැලකිය යුතුයි :*

(1) සියලුම පාඨමාලාවලට අදාළ විෂයය නිර්දේශ සංශෝධනයට යටත්ව ඇති අතර, 2011 වර්ෂයේ දී ඇතැම් පාඨමාලා සංශෝධිත විෂයය නිර්දේශයට අනුව ක්‍රියාත්මක වන අතර, එහි දී පාඨමාලා කාලය වෙනස් විය හැකිය.
(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) පාඨමාලාව පළමු සහ දෙවන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සති අන්තයේ ද දේශන පවත්වනු ඇත.
(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණකාලීන) පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී දේශන පවත්වනු ලබන අතර තෙවන වසර සඳහා දේශන පවත්වනු ලබන්නේ සති අන්තයේ දී ය.
(4) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.
(5) ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙ.) ඒකාබද්ධ ලකුණු හෝ Z-Score සැලකිල්ලට ගනු ලැබේ.
(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(7) දිවා/පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 22ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(8) කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාල පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතන අංශයකට මාරු කරනු නොලැබේ.

**"*ආ*" කොටස**

පාඨමාලාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ:-

01. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් :-

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණය විෂයය ඇතුළත්ව විෂයයන් හතරෙන්ම සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් දෙකකට එම අවස්ථාවේම හෝ වෙනත් අවස්ථාවක දී හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණ විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය;

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය ඇතුළුව විෂයයන් තුනෙන්ම සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතුය. සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

සහ

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරෙන් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනෙන් ලබාගත් ඉහළම ලකුණු තෝරා ගැනීමේ පදනම වේ.

1.1 *උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන)*

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් :-

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ අන්තර් මාධ්‍ය පරීක්‍ෂණය හෝ සමත්වීම;
(ii) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ එක් අවස්ථාවක දී විෂයයන් තුනකින් සාමාර්ථයක් ලබා තිබීම;
(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;
(iv) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම;
(v) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

*සැ. යු.-(අ)* *ප්‍රායෝගික පළපුරුද්ද.*—අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතුය.

*(ආ)* පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි 11 වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ව්‍යාපාර අධ්‍යයන/මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
(ii) උසස් ජාතික වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමා හෝ එහි II වසර පරීක්ෂණය
(iii) විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය
(iv) වාණිජවේදී උපාධිය
(v) විද්‍යාවේදී (ගණකාධිකරණය) උපාධිය
(vi) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(vii) වරලත් කළමණාකාරිත්ව හා ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(viii) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්‍ෂණය

**02. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශය යටතේ එකවරක දී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් තිබිය යුතුය.

(i) අ. පො. ස. (උ. පෙළ) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය සහ ගණකාධිකරණ යන විෂයයන් තුනෙන් අ. පො. ස. (උ. පෙ.) සාමාර්ථයක් හෝ ඉහත සඳහන් විෂයයන් දෙකකින් සහ ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය හෝ ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරෙන් එක් විෂයයක්ද, සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

(ii) අ. පො. ස. (උ. පෙළ) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් එක්වරකදී සමාර්ථය ලබා තිබීම;

හෝ

(i) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

සහ

(ii) අ. පො. ස. (සා. පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන/අර්ධ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් තිබිය යුතුය.

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, ශුද්ධ ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(iii) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(iv) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව , ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*සහ*

(v) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.
කෘෂි විද්‍යාව අ.පො.ස. (උ.පෙ.) 1995 සිට ක්‍රියාත්මක වන නව විෂයය නිර්දේශය වේ.

**05. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) (දිවා/පූර්ණ කාලීන)**

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) එක් වතාවක දී අ.පො.ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

*සහ*

(iii) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**06. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (පූර්ණ කාලීන/අර්ධ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය. :

(i) අ. පො. ස. (උ/පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ
අ. පො. ස. (සා./පෙ.) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ (සී) සාමාර්ථයක්; හෝ

(ii) අ. පො. ස. (උ/පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා "සී" සමාර්ථය

හෝ

(iii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි).

හෝ

(iv) අ. පො. ස (උ. පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ. පො. ස. (උ. පෙ.) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා "සී" සමාර්ථය

හෝ

(v) අ. පො. ස. (උ. පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

**07. උසස් ජාතික ව්‍යාපාර හා මූල්‍ය ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය :

(i) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරකදී සමත් වී තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක්වරකදී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

*හෝ*

(iii) ගණකාධිකරණ ශිල්පීය හා පුහුණු ආයතනයේ ජාතික සහතික පත්‍ර විභාගය සමත්වී තිබීම;

*සහ*

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :

1. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා අර්ධ කාලින පාඨමාලාව යාපනය, ත්‍රිකුණාමලය, සමන්තුරේ, මඩකලපුව මහනුවර හා දෙහිවල යන ආයතනවල දෙමළ මාධ්‍යයෙන් ද, දෙහිවල හා මහනුවර ඇතුළුව අර්ධ කාලීන පාඨමාලාව පැවැත්වෙන අනෙකුත් ආයතනවල සිංහල මාධ්‍යයෙන් ද පැවැත්වේ. දෙහිවල උසස් තාක්‍ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වෙනු ඇත.

2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය 2008 ඔක්තෝබර් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 (iii) අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ විද්‍යාවේදී උපාධිය, සාමාන්‍ය සාමාර්ථයට සමානව පිළිගෙන ඇත.

3. ඔබගේ සුදුසුකම්වලට අනුව ඔබ ප්‍රවේශය සඳහා සලකා බැලීමට කැමති පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2010.10.29 වේ.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
Web site : www.sliate.net

*Office use only* – Course Number ..........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSE***

Name of the Institute/Institute Section :————.

| *Name of the Course* | *Order of Preference* | *Medium* |
|---|---|---|
| 1. ............................ | .......................................... | ............................... |
| 2. ............................ | .......................................... | ............................... |
| 3. ............................ | .......................................... | ............................... |

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Address :————.

4. Date of Birth :
Year :————., Month :————., Date :————.

Age (as at 01.01.2011) :
Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. Sex :————.
(Male/Female)
7. Administrative District :————. Contact Number :————.

8. (i) Results of GCE (A/L) Examination (in or before 2009)

Year :————., Index No. :————. Medium :————.

| *Pass Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... |

If under new syllabus indicate pass or fail in the general paper :————.

Aggregate/Average marks or Z-score of the above examination, issued by the Department of Examination :————.

(ii) Result of GCE (O/L) Examination :————.

Year :————. Index No.:————. Medium :————.

| *Subject* | *Grade* | *Subject* | *Grade* |
|---|---|---|---|
| 1. ..................................... | ..................................... | 6 . ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... | 7 . ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... | 8 . ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... | 9 . ..................................... | ..................................... |
| 5. ..................................... | ..................................... | 10 . ..................................... | ..................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Details of Occupation : Date of Appointment :————.
(only for part-time/weekend courses)

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.

I hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full-time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The Bank receipt for Rs. 250 payable to SLIATE should be annexed).

10-633

---

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය - 2010**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා වන සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 ජනවාරි මස පහත සඳහන් නගරවලදී පවත්වනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන නගරවල විභාගය පැවැත්වීම ආසන්න නගරයට සංශෝධනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලයේ/රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| බදුල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |

02. 2010.01.01 වන දිනට ඇති වී තිබෙන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ තනතුරුවල පුරප්පාඩු වලින් 35% ක් මෙම විභාගයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ඇත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(IV) හි MN 07/2006-A වැටුප් බණ්ඩය මෙම තනතුරට හිමිවන අතර ඒ අනුව මාසික වැටුප් පරිමාණය රු. 20,030-11x365-18x500-රු. 33,045 වේ.

04. සුදුසුකම්.- 2010.01.01 වන දිනට පූර්වාසන්න අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ මධ්‍යම රජයට අයත්,—

(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වැනි පන්තියේ නිලධාරීහු ද,
(ආ) අවම වශයෙන් සේවයේ වසර 08 කට නොඅඩු වූ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරීහු ද,
(ඇ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I හා II පන්තිවල උපාධිධාරී නිලධාරීහු ද මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

*සටහන 1* : සතුටුදායක සේවා කාලය හා සක්‍රීය සේවා කාලය යන්න සේවා ව්‍යවස්ථාවේ 2:6, 2:7 ඡේද යටතේ නිර්වචනය කර ඇත.

05. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 දක්වා පළමුවන පිටුවට ද, 6.0 සිට 9.0 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන සේ ගෙන සකස් කළ යුතුය. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර මෙයට යා කර ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර සෙ. මී. 25.5 x 21 ප්‍රමාණයේ කඩදාසියක ( A4 ප්‍රමාණයේ ) දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම සකස් කර ගත යුතුය. ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුත්තේ අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම ය. ඉල්ලුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට පසුව භාෂා මාධ්‍යය සම්බන්ධයෙන් කිසිදු වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) අපේක්ෂකයින් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, ඡායා පිටපතක් ද සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ලබා ගැනීමෙන් පසු ඡායා පිටපත පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කර මුල් පිටපත තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට 2010 නොවැම්බර් 16 දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවනු ලබන අයදුම්පත්‍රයට අමතරව වෙනත් කිසිදු අයදුම්පත්‍ර පිටපතක් පෞද්ගලිකව එවීම නොකළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑම අයදුම්පතක්ම සෑම අයුරකින්ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර අයදුම්පතේ ඇති සහතිකය ද අත්සන් කළ යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනයකට නොඑවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා වන සීමිත තරග විභාගය - 2010" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඇ) (i) පළමුවන වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. එනම් සාමාන්‍ය ලිපිකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා 1972, 1973, 1974, 1975, 1976, 1978, 1979, 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හෝ 2001 වර්ෂවල පවත්වන ලද සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1985 හා 1996 වර්ෂවල පවත්වන ලද රජයේ යතුරු ලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1996 වර්ෂයේ දී පවත්වන ලද රජයේ ලඝු ලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1999 වර්ෂයේ දී පවත්වන ලද රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ හෝ රජයේ ගබඩා භාරකාර සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට හා 2006, 2007 වර්ෂවල දී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගයට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙනි.

(ii) විභාග සඳහා ගාස්තුව රු. 400/-කි. මෙම ගාස්තුව ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම ළඟම ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීමට ගෙවිය යුතුය. මුදල් ගෙවීම් වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සිය ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු වේ. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඈ) අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දින කිහිපය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(ඉ) ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

06. *විභාගයට ඇතුළත් කර ගැනීම :*

(අ) ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි විභාග ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ඇ) අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියළුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.

(ඈ) යම් කිසි අපේක්ෂකයකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් දින හතකට පෙර) තමාගේ ප්‍රවේශපත්‍රය නොලැබුණහොත් ඒ බව වහාම "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට දැනුම් දිය යුතුය. (විදුලි පණිවිඩ ලිපිනය "විභාග බත්තරමුල්ල", ෆැක්ස් අංකය 2784232 වේ) ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දෙන අතරම පහත සඳහන් තොරතුරුද සැපයිය යුතු ය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායාපිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඔබගේ ඉල්ලීම් ලිපියේ ඡායා පිටපතක් ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

සටහන.- විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුය. කෙසේ වුවද විභාග කොමසාරිස් ජනරාල් විසින් ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට තාවකාලිකව අවසර දිය හැකිය. ඒ අනුව විභාග කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.-* අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයන් සඳහා විභාග ශාලාධිපති තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් පත්‍රිකාවලින් එකක් පමණි.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්.-

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත්, හෝ ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙලිවුවහොත් හෝ ඔහු/ඇය තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

09. *විභාග මාධ්‍යය*.- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් විසින් තමන් සේවයට ඇතුළත්වීම සඳහා තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂා මාධ්‍යයකින් හෝ උත්තර සැපයිය යුතුය.

10. *විභාග පරිපාටිය*.- ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| *විෂය* | *ලකුණු* | *කාලය (පැය)* |
|---|---|---|
| 1. කාර්යාල කළමනාකරණය | 100 යි | 02 යි |
| 2. කාර්යාල ක්‍රම | 100 යි | 02 යි |
| 3. ආයතන කාර්ය පරිපාටිය | 100 යි | 02 යි |
| 4. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 යි | 02 යි |
| 5. පොදු ප්‍රශ්න පත්‍රය | 100 යි | 1 1/2 යි |
| | 500 යි | |

11. *පත් කිරීම සඳහා තෝරා ගැනීම*.- මෙම විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල අනුපිළිවෙල අනුව, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හමුවට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි කාර්යාලයක සේවය කිරීමට සූදානම් විය යුතුය. අනුයුක්ත කෙරෙන කාර්යාලයේ පත්වීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කර ඊළඟට සුදුසුකම් ලබන අයවලුන් පිළිවෙලින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

12. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 1372/23 හා 2004 දෙසැම්බර් මස 24 වැනි දින *ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති 2004.12.15 දාතම දරන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවේ දැනටමත් කර ඇති හෝ මතුවටත් කරනු ලබන සංශෝධනවලට ද යටත්ව සහ අංක 09/1041/360/034 හා 2009.11.11 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල ලිපියේ අංක 03හි (i) හා (iv) අනුව ද මෙම පත්වීම් කරනු ලැබේ.

13. *විෂය නිර්දේශය* .- අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් විෂයයන් පිළිබඳව දැනුමක් අපේක්ෂා කරනු ලැබේ.

1. *කාර්යාල කළමනාකරණය* .- සංවිධාන ව්‍යුහය, සංවිධාන මූලධර්ම, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාවය, සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය.

2. *කාර්යාල ක්‍රම*.- කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පරිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැලසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැලැස්ම හා වටපිටාව, ඛකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත.

3. *ආයතන කාර්ය පරිපාටිය*.- රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත්කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, ශුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

4. *රාජ්‍ය මූල්‍ය කළමනාකරණය*.- වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාරගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවා, ටෙන්ඩර් කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිතවන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, මූල්‍ය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

5. *පොදු ප්‍රශ්න පත්‍රය*.- රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාර ධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ ශුභ සාධන කටයුතු, නිල තත්ත්වය හා සිවිල් තත්ත්වය පිළිබඳ සමාජයීය පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

14. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නො පිරවීමට ද , මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණය ගැනීමට ද අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

15. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂාපාඨය බලපැවැත්විය යුත්තේ ය.

අමාත්‍ය මණ්ඩලයේ නියෝගය පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරස්‍රයේ,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා)

## LIMITED COMPETITIVE EXAMINATION FOR APPOINTMENT TO SUPRA CLASS OF THE PUBLIC MANAGEMENT ASSISTANTS SERVICE - 2010

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට පත් කිරීමේ සීමිත තරග විභාගය - 2010

ගැසට් නිවේදනය අනුව අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර දෙකක් කැමැත්ත අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ගැසට් නිවේදනයේ පළමුවන ඡේදය බලන්න.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

විභාගයට ඉදිරිපත්වන මාධ්‍ය (සිංහල - 2/ දෙමළ - 3/ඉංග්‍රීසි - 4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01.0 මුලකුරු සමග නම :————. මයා /මිය / මෙනෙවිය (සිංහලෙන්/දෙමළෙන්)

01.01 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

01.02 සම්පූර්ණ නම - (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

01.03 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————.

2.0 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :————.

2.2 රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————. (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1 පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 විවාහක /අවිවාහක බව:

අවිවාහකයි -1 විවාහකයි -2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 ජාතික හැඳුනුම්පත් අංකය :

6.0 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

6.1 2010.01.01 දිනට වයස :

අවුරුදු : මාස : දින :

7.0 මෙම විභාගය 1972, 1973, 1974, 1975, 1976, 1978, 1979, 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හා 2001 යන වර්ෂවල පවත්වන ලද සාමාන්‍ය ලිපිකාර සේවයේ /1985, 1999 රජයේ යතුරු ලේඛක සේවයේ/ 1996 රජයේ ලඝු ලේඛක සේවයේ / 1999 රජයේ පොත්තබන්නා සේවයේ/ 1999 රජයේ සරප් සේවයේ හෝ 1999 රජයේ ගබඩා භාරකාර සේවයේ හෝ 2006, 2007 වර්ෂවල දී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගවලින් කවරකට හෝ ඔබ පෙනී සිටියේ ද ? :————.

8.0 (i) සාමාන්‍ය ලිපිකාර සේවයට/ රජයේ යතුරු ලේඛක සේවයට / රජයේ ලඝුලේඛක සේවයට / රජයේ පොත් තබන්නා සේවයට / රජයේ සරප් සේවයට / රජයේ ගබඩා භාරකාර සේවයට පත් වූ දිනය :————.

(ii ) 2010.01.01 දිනට එහි මුළු සේවා කාලය

අවුරුදු : මාස : දින :

(iii) 2010.01.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු දින ගණන :————.

(iv) 2010.01.01 දිනට සක්‍රීය සේවා කාලය :

අවුරුදු : මාස : දින :

(v) සාමාන්‍ය ලිපිකාර සේවයේ/ රජයේ යතුරු ලේඛක සේවයේ / රජයේ ලඝු ලේඛක සේවයේ / රජයේ පොත් තබන්නා සේවයේ / රජයේ සරප් සේවයේ / රජයේ ගබඩා භාරකාර සේවයේ පත්වීම ස්ථිර කරන ලද දිනය :————.

(vi) දැනට සිටින පන්තිය හා ඊට ඇතුළත් වූ දිනය :————.

(vii) ඔබ උපාධිධාරියෙකු නම් උපාධිය ලැබූ වර්ෂය, විශ්ව විද්‍යාලයේ නම :————.

(viii) උපාධිය බලපැවැත්වීමේ ආරම්භක දිනය ( Effective Date) :

9.0 (i) ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයට / රජයේ යතුරුලේඛක සේවයට / රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත්තබන්නා සේවයට /රජයේ සරප් සේවයට / රජයේ ගබඩා භාරකාර සේවයට ඇතුළත්වීම සඳහා වූ තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

(ii) තරග විභාගයක් රහිතව ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයට / රජයේ යතුරු ලේඛක සේවයට / රජයේ ලඝුලේඛක සේවයට / රජයේ සරප් සේවයට / රජයේ ගබඩා භාරකාර සේවයට බඳවා ගන්නා ලද්දේ නම් එම සේවයට ඇතුළත් වීම සඳහා ඔබ සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යය :————.

10.0 අයදුම්කරුගේ සහතිකය :

මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි,

(අ) 2010.01.01 දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ ලැබිය යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති අතර (සේවා හා දෙපාර්තමේන්තුමය පරීක්ෂණ පැවැත්වීම කොන්දේසියක් වන චේතනාධික හැර ) එම කාලය තුළ කවර ආකාරයක හෝ කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නැති බවත්,

(ආ) මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය ඒවා බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් /විභාග ගාස්තු ගෙවන ලද අංක ................. හා ..........වැනි දින දරන මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බවත්/ විභාග පිළිබඳ නීතිරීතිවලට එකගව ක්‍රියා කිරීමට මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

————,
නිලධාරියාගේ/නිලධාරිණියගේ
අත්සන.

දිනය :————.

### ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..................... නමැති අයදුම්කරු / අයදුම්කාරිය .................. වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, පසු පිටුවේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයෙහි ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, මොහු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබීමට සුදුසු බවත්, විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 13 හා 1972.10.02 වැනි දින දරන චක්‍රලේඛ ලිපියෙහි පරිදි ඒ බවට සටහනක් නිලධාරියාගේ චර්යා සටහන් පත්‍රයෙහි තබන්නට යෙදුණු බවත් මෙම විභාගයට නියමිත සුදුසුකම් අයදුම්කරු සපුරා ඇති බවත්, 2010 .................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. මොහු/මැය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකය .................. හා දිනය ......... වේ.

————,
ආයතන ප්‍රධානියාගේ
අත්සන සහ නිලමුද්‍රාව.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.

පදවිය :————.

ලිපිනය :————.

| විභාග ගාස්තු ගෙවන ලද මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය ගැලවී නොයන ලෙස එහි උඩ කෙළවරේ පමණක් මැලියම් ගා ප්‍රවේශමෙන් මෙහි අලවන්න. |
|---|

10-612

## ක්‍රීඩා අමාත්‍යාංශය

### ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

### ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව — 2010/2011

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව අවුරුදු 45ට නොවැඩි විය යුතුය) අතර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

1.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී දෙවතාවකට නොවැඩි පෙනී සිටීමකින් විෂයයන් 06කින් සාමාර්ථය සහ එම විෂයයන් හයෙන් දෙකක් සිංහල හෝ දෙමළ සහ ගණිතය හෝ අංක ගණිතය විය යුතුය.

1.2 තව ද, ඔහු හෝ ඇය

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළමු, දෙවන හෝ තෙවන ස්ථාන ලබා තිබීම හෝ එම උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී කේවල ඉසව්වක ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම ස්ථානය ලබා තිබීම.

හෝ

(ආ) ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී කේවල ඉසව්වක ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම හෝ දෙවන ස්ථාන ලබා තිබීම

හෝ

(ඇ) ජාතික පාසල් ක්‍රීඩා තරගාවලියේ වයස 16න් ඉහළ කේවල තරගයක ප්‍රථම ස්ථානය දිනා තිබීම හෝ කණ්ඩායම් තරගයට ශූරතාවය දිනා තිබීම

හෝ

(ඈ) ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් දකුණු ආසියාතික තරග, ආසියාතික ශූරතා තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මාණ්ඩලීය, ලෝක කුසලාන, හෝ ඔලිම්පික් තරගයකට සහභාගී වී තිබීම

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයක හෝ පළාත් සභාවක ක්‍රීඩා නිලධාරියකු හෝ නිලධාරිණියක වශයෙන් සේවය කිරීම, හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක වශයෙන් සේවය කිරීම (සටහන 01ට අදාළ අවශ්‍යතාවන් සපුරා තිබීම අනිවාර්ය වේ)

හෝ

(ඊ) රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයකු, ගුරුවරියක, පුහුණුකරුවකු හෝ පුහුණුකාරිණියක (ස්වේච්ඡා වුව ද විය හැක) වීම, තරුණ සේවා සභාවේ ක්‍රීඩා නිලධාරියෙකු නිලධාරිණියක වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් සහිතව ජාතික ක්‍රීඩා සංගමයකින් ලබාගත් ක්‍රීඩා පුහුණු කිරීමේ අදියර බලපත්‍රයක් ලබා තිබීම;

හෝ

(උ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු උපදේශකවරයකු/වරියක වශයෙන් මාස 06කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත් වී තිබීම.

සැ. යු.- සටහන

01. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වූවන් වසර 01ක සේවා කාලයක් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වූවන් වසර 05ක (විද්‍යාපීඨ අභ්‍යාසලාභී ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා පමණක් වසර 02ක) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

02. නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

2. *අයදුම්පත් එවීමේ ක්‍රමය :*

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 1/2" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2010.11.15 වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ "2010/2011 ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.4 විභාග ගාස්තු වශයෙන් රු. 350ක මුදල් ඇණවුමක් "ලේකම් ක්‍රීඩා අමාත්‍යාංශය" නමට කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි වන ලෙස අයදුම්පත සමග එවිය යුතුය.

3. *තෝරා ගැනීම :*

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියළු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. *පාඨමාලාව පිළිබඳ විස්තර :*

4.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05කින් යුක්ත ය.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත (ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැළසුම් ක්‍රම, භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම ආදී වශයෙනි) සහ වාචික පරීක්ෂණය;

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම;

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය;

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය. (පාපන්දු/ වොලිබෝල්/ නෙට්බෝල්/ පැසිපන්දු)

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලනය, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝ විද්‍යාව වැනි පොදු විෂයයන් අධ්‍යයනය කිරීම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, රැකියා විරහිත අයදුම්කරුවන් විසින් රු. 15,000ක මුදලක් ද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හෝ පලාත් සභාවල රැකියාවන්හි නිරත අයදුම්කරුවන් විසින් පෞද්ගලිකව හෝ ආයතනය මගින් රු. 30,000ක මුදලක් ද, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ආදායකයා ලෙස "ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය" යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. *අනෙකුත් කොන්දේසි :*

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි අවාරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

එස්. ලියනගම,
ලේකම්.

ක්‍රීඩා අමාත්‍යාංශය,
අංක 7ඒ, රීඩ් මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - 2010/2011 වර්ෂය***

*ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය*

01. (i) සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම :————.
(iii) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |

(iv) ජාතික හැඳුනුම්පත් අංකය :————.

02. ලිපිනය (i) පෞද්ගලික :————.
(ii) කාර්යාලීය :————.

03. (i) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) 2010.11.15 දිනට වයස :

වර්ෂ : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? නැති ද ? යන වග :————.
පුරවැසියෙක් නම් ලියාපදිංචි වීමෙන් ද ? පරම්පාරාවෙන් ද ? යන වග :————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ii) විවාහක/අවිවාහක බව :————.

06. ඔබ රැකියාවක් කරයි ද ? / නොකරයි ද ? යන වග :————.

(i) සේවා ස්ථානය :————.
(ii) දැනට දරන තනතුර :————.
(iii) රැකියාවේ සේවා කාලය :————.

07. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :

| *වර්ෂය* | *විභාගය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න)

09 (i) ගැසට් නිවේදනය අනුව ඔබ මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන්නේ ඉහත 1.2 ඡේදයේ අ, ආ, ඇ, ඈ, ඉ, ඊ. උ. දක්වා වන ඡේදවලින් කුමන ඡේදය යටතේ ද ? :————.

(ii) අදාල ඡේදය යටතේ ඔබ ලබා ඇති ක්‍රීඩා සුදුසුකම් විස්තර සහිතව සඳහන් කරන්න. :————.

10. *වෙනත් කරුණු :*

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත්, රු. 15,000ක හෝ රු. 30,000ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද යන වග

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,

මෙම ...........................සේවය කරන ................. වන ................................ මහතා/ මහත්මිය/මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :————.
දිනය :————.
නම :————.
තනතුර :————.

10-511